# ගිහි ජනතාවගේ අපෝස්තලිකත්වය (**DECREE ON THE APOSTOLATE OF THE LAITY - *APOSTOLICAM ACTUOSITATEM***) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නියෝගයඃ ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්

ඩබ්. අයි. ඩී. ප්‍රනාන්දු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

පූර්වොක්ත පර්යේෂණ මාතෘකාව අධ්‍යයනය කිරීම උදෙසා දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ විද්වතකු වන ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහ ප්‍රාථමික මූලාශ්‍රයක් (Primary Source) ලෙස භාවිතයට ගෙන **ගිහි අපෝස්තලිකත්වය පිළිබඳ නියෝගය** සකස් වූ ආකාරය හා එයට පසුබිම් වූ කරුණු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙහි පර්යේෂණ අරමුණ වේ.

උක්ත ප්‍රකාශය විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමේ දී හමු වූ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වූයේ සභාවේ පැවැත්ම තීරණය වන්නේ පූජකවරුන් හා පැවිදිවරුන් මත පමණක් ද, ගිහියා යනු සභාවේ හුදු නාමික අංශයක් පමණක් ද යන්නයි.

මෙම ගැටලුව නිරාකරණය කිරීමේ දී තහවුරු වූයේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පැවැත්වීමට පෙර පැවති සභා ධූරාවලිය මෙම මන්ත්‍රණ සභාවේ ද දැකිය හැකි වූ නමුත් මන්ත්‍රණ සභාවේ අවසාන භාගයේ දී එම තත්ත්වය ක්‍රමයෙන් අවම වූ බව යි. ඒ අනුව පූජකවරුන් හා පැවිදිවරුන්ට සභාව තුළ ආවේණික වූ දූත මෙහෙවරක් ඉටු කිරීමට ඇත්තා සේ ම ගිහියන්ට ද එම සභාවේ ඔවුන්ට ම හිමි කිතුනු වගකීම් ඇති බවත් ගිහියා ද පූජකවරුන් හා පැවිදිවරුන් මෙන් ම නිල සභාවේ පැවැත්මට සෘජුව ම දායක වන බවත් මෙම පර්යේෂණය මගින් පැහැදිලි කර ගත හැකි විය.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකි වේ. ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පදඃ** ගිහියා, වතිකාන මන්ත්‍රණ සභාව, සභාව